# වාර්ෂික වාර්තාව

## 2018

### සංචාරක සංවර්ධන අරමුදල



# සංචාරක සංවර්ධන අරමුදල
# වාර්ෂික වාර්තාව 2018

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2019 ජුනි මස 01 වන දින
ගරු ජෝන් අමරතුංග මහතා,
සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු අමාත්‍යතුමනි,

**යොමුව: සංචාරක සංවර්ධන අරමුදල.**

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ පිහිටුවා ඇති සංචාරක සංවර්ධන බද්දේ මූල්‍යමය සම්පත් සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා යොදා ගත යුතු බව ඔබගේ කාරුණික අවධානයට ලක් කිරීමට කැමැත්තෙමි. මෙම අරමුදලට මුදල් සපයා ගැනීම මෙන්ම ඒවා බෙදාහැරීම එකී 2005 අංක 38 දරණ සංචාරක පනත මගින් තීරණය කෙරේ.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (2) වන වගන්තියට අනුව, සිවිල් ගුවන් සේවා අධිකාරිය සංචාරක අපගමන බද්දෙන් ඇ.ඩො. 5 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ලබා දේ. තවද, සංචාරක ක්ෂේත්‍රයේ නිරත සමාගම් විසින් සංචාරක සංවර්ධන බදු ලෙස කාර්තුමය පදනම මත උක්ත අරමුදල වෙත මුදල් ගෙවනු ලැබේ.

2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලසීමාව තුල සංචාරක සංවර්ධන බද්දේ මුළු මුදල රු.මිලි. 4,318.33 ක් වන අතර,එය 2017 වසරේදී රු.මිලි.3,932.64 ක් විය.

2018 වසර තුලදී උක්ත අරමුදලට ලැබූ හා එය විසින් ලබා දුන් මුදල් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ අඩංගු වේ.

ස්තුතියි.
අත්සන් කළේ,

ජොහාන් ජයරත්න,
සභාපති,
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

# පටුන

පිටු අංක

හැඳින්වීම ..........................................................................01

මූල්‍ය තත්ව ප්‍රකාශය ......................................................................03

මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය ..........................................................04

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය ..........................................................05

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ....................................................................06

ගිණුම්වලට සටහන් ........................................................................07 - 10

# හැඳින්වීම

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23(1) වගන්තිය යටතේ ස්ථාපිත ඇති සංචාරක සංවර්ධන අරමුදල සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ස්ථාපිත කර ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් මෙම අරමුදල පාලනය කිරීම හා මෙහෙයවීම සිදු කෙරේ.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23(2) වගන්තිය අනුව, සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් 2003 අංක 25 දරණ මූල්‍ය පනතේ 2 වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන අරමුදලට ගෙවන අපගමන බද්දෙන් ඇ ඩො 5 ක ප්‍රමාණයක් ලබා දේ.

තවද, 2003 අංක 23 දරණ මුදල් පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සියළුම ලියාපදිංචි සංචාරක ආයතන වලින් සංචාරක සංවර්ධන බද්දක් පනවා,රැස්කිරීම සිදු කරයි.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 24(8)වගන්තිය අනුව,අරමුදලට බැරවෙන මුදල් සියල්ලම පහත පරිදි බෙදා හරිනු ඇත.

a. 2005 අංක 38 දරණ සංචාරක පනතේ 40 වගන්ති යටතේ 70% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සඳහා

b. 2005 අංක 38 දරණ සංචාරක පනතේ 33 වගන්ති යටතේ 12% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සඳහා

c. 2005 අංක 38 දරණ සංචාරක පනතේ 2 වගන්ති යටතේ 14% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා

d. 2005 අංක 38 දරණ සංචාරක පනතේ 42 වගන්ති යටතේ 4% ක මුදලක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සඳහා

2018 වසර තුළදී සංචාරක සංවර්ධන අරමුදලට ලත් මුදල් හා ලබා දුන් මුදල් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

**සංචාරක සංවර්ධන අරමුදල**
**2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය**

| | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 8 | 423,551,431.34 | 373,591,199.92 |
| ලැබිය යුතු දෑ | 9 | 965,402,889.56 | 929,169,127.34 |
| **මුළු වත්කම්** | | **1,388,954,320.90** | **1,302,760,327.26** |
| | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | 10 | 12,139,294.60 | 5,385,778.10 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | | 192,754,103.70 | 181,632,436.90 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | | 963,770,518.41 | 908,162,184.42 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | | 165,217,803.13 | 155,684,945.87 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | | 55,072,601.06 | 51,894,981.97 |
| **මුළු වගකීම්** | | **1,388,954,320.90** | **1,302,760,327.26** |

එස්.එස්.කේ.ගනේපලආරච්චි
අධ්‍යක්ෂ/මූල්‍ය කළමනාකරණ

මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි පිටු අංක 7- 9 දක්වා මූල්‍ය ප්‍රකාශන වල අත්‍යාවශ්‍ය අංගයක් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ඇතුලත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

පී.යූ.රත්නායක
අධ්‍යක්ෂ/ජනරාල්

එච්.කේ.පී.කේ.ගෝමස්
සභාපති

එම්.ශාන්ති කුමාර්
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**සංචාරක සංවර්ධන අරමුදල**
**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්‍යසාධන ප්‍රකාශය**

| | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු | 3 | 4,307,052,039.98 | 3,920,297,545.25 |
| අනෙකුත් ආදායම් | 4 | 11,380,693.34 | 12,342,049.05 |
| **මුළු ආදායම** | | **4,318,432,733.32** | **3,932,639,594.30** |
| | | | |
| **වියදම්** | | | |
| අරමුදල් පරිපාලන වියදම් | 5 | 7,663,195.69 | 7,963,924.09 |
| මූල්‍ය වියදම් | 6 | 40,184.34 | 31,065.00 |
| අරමුදල් බෙදාහැරීම් | 7 | 4,310,429,353.29 | 3,924,644,605.21 |
| **මුළු වියදම්** | | **4,318,132,733.32** | **3,932,639,594.30** |
| | | | |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌනතාවය | | **300,000.00** | |

# හිමිකම් වෙනස්විමේ ප්‍රකාශය

2005 අංක 38 දරණ සංචාරක  පනත හා 2003 අංක 28 දරණ මුල්‍ය පනතට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකරණය හා පරිපාලනය සඳහා සංචාරක සංවර්ධන අරමුදල ක්‍රියාත්මක කර ඇත. එබැවින් සංචාරක සංවර්ධන අරමුදල සඳහා හිමිකම් වෙනස්විමේ ප්‍රකාශයක් සකස් කරනු නොලැබේ අරමුදලේ සිදුවෙන ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස අරමුදල විසින් ලාභ හෝ අලාභ උපයනු නොලැබේ මුළු ශුද්ධ ආදායම 2005 අංක 38 දරණ සංචාරක පනත මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි ආයතන හතර අතර පහත ලෙසින් බෙදා හරිනු ලැබේ.

| | |
|---|---|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 14% |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 70% |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | 12% |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 4% |

**සංචාරක සංවර්ධන අරමුදල**
**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් හි මුදල් ප්‍රවාහයන්** | | |
| **ලැබීම්** | | |
| සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු | 4,281,155,959.68 | 3,790,893,902.94 |
| අනෙකුත් ලැබීම් | 58,675,983.71 | 4,038,057.64 |
| **ගෙවීම්** | | |
| බෙදාහැරීම් | (4,230,988,846.15) | (4,056,960,725.81) |
| අනෙකුත් ගෙවීම් | (58,882,836.45) | (4,142,940.19) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | **49,960,231.42** | **(266,171,704.80)** |
| මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | - | - |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ අඩුවීම/වැඩිවීම | **49,960,231.42** | **(266,171,704.80)** |
| මුදල් හා මුදල් සමාන දෑ හි ආරම්භක ශේෂය | **373,591,199.92** | **639,762,904.72** |
| මුදල් හා මුදල් සමාන දෑ හි අවසාන ශේෂය | **423,551,431.34** | **373,591,199.92** |

# ගිණුම් වලට සටහන්

## 1 සංචාරක සංවර්ධන අරමුදල

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (i) වගන්තිය යටතේ ''සංචාරක සංවර්ධන අරමුදල'' ස්ථාපිත කර ඇත. මෙම අරමුදලේ මුල්‍යයන් සංචාරක සංවර්ධන සහ ප්‍රවර්ධනය සඳහා යොදවනු ලබයි. සංචාරක සංවර්ධන බදු එකතු කිරීම හා බෙදාහැරීම 2003 අංක 28 දරණ මුල්‍ය පනත සහ 2005 අංක 38 දරණ සංචාරක පනත අනුව සිදු කරයි.

## 2 ගිණුම්කරණ අවශ්‍යතා

අරමුදලේ ගිණුම් සකස් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ගිණුම් ප්‍රමිත අනුව පිළියෙල කර ඇත.

## 3 බදු අරමුදල්

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| 3.1 අපගමන බදු | 2,824,969,839.98 | 2,378,828,212.64 |
| 3.2 සංචාරක සංවර්ධන බදු | 1,482,082,200.00 | 1,541,469,332.61 |
| **එකතුව** | **4,307,052,039.98** | **3,920,297,545.25** |

### 3.1 අපගමන බදු

සංචාරක පනතේ 23 (2) (අ) වගන්තිය යටතේ සමස්ථ අපගමන බදු ආදායම් ඇමරිකානු ඩොලර් 15 ක් වු ප්‍රමාණයකින් 1/3 (ඇමෙරිකානු ඩොලර් 5) ක ප්‍රමාණයක් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවනු ලැබේ.

| අපගමන බදු | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| 2018 ජනවාරි සිට ඔක්තොම්බර් දක්වා අපගමන බදු ලැබීම් | 2,356,658,842.09 | 2,001,093,146.48 |
| 2018 නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා අපගමන බදු ලැබීම් | 468,310,997.89 | 377,735,066.16 |
| **මුළු අපගමන බදු** | **2,824,969,839.98** | **2,378,828,212.64** |

සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ලබාදෙන ඇස්තමේන්තුවෙන් 2018 නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා අපගමන බදු ප්‍රතිපාදන වශයෙන් රු.468,310,997.89 දක්වා ඇත.

### 3.2 සංචාරක සංවර්ධන බදු

2003 අංක 28 දරණ මුල්‍ය පනතට අනුව සංචාරක ක්ෂේත්‍රයට අයත් සෑම ආයතනයක්ම සංචාරක සංවර්ධන බදු ගෙවිය යුතුය. සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක බදු මුදල් එකතු කිරීම හා සංචාරක සංවර්ධන අරමුදලට බැර කිරීම කරනු ලැබේ. 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අදාල කාලපරිච්ජේදය තුල රුපියල් මිලියන 1,062 ක මුදලක් බදු වශයෙන් එකතු වී ඇත. තවද 2018 ඔක්තොම්බර් සිට දෙසැම්බර් කාලපරිච්ජේදය සඳහා අපගමන බදු වශයෙන් රුපියල් මිලියන 496 ක මුදලක් ඇස්තමේන්තුගත ආදායම ලෙස ගිණුම් ගත කොට ඇත. මෙම වර්ෂයේ අවසාන කාර්තුවේ ලද සත්‍ය සංචාරක සංවර්ධන බදු ලැබීම්වල 5% ක වර්ධන ප්‍රතිශතයක් ලෙස මෙම මුදල ඇස්තමේන්තු කර ඇත.

| සංචාරක සංවර්ධන බදු | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මුදල් ලැබීම් | 1,062,165,977.30 | 992,141,806.70 |
| 2018 ඔක්තොම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු | 496,895,172.60 | 549,656,830.58 |
| 2017 ඔක්තොම්බර් සිට දෙසැම්බර් දක්වා අධිවෙන්කිරීම් | (76,423,332.87) | - |
| සංචාරක සංවර්ධන බදු ආපසු ගෙවීම් | (555,617.03) | (329,304.67) |
| **මුළු සංචාරක සංවර්ධන බදු** | **1,482,082,200.00** | **1,541,469,332.61** |

### 4 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් ලෙස ගිණුම් ගත කොට ඇති වටිනාකම තුල මූලිකව අන්තර්ගත වන්නේ 2003 අංක 27 දරණ මුල්‍ය පනත ප්‍රකාරව නියමිත දිනට ගෙවීම් සිදුනොකල ලියාපදිංචි ආයතනයන්හි ප්‍රමාද ගෙවීම් මත අයකල පොලි ආදායම වේ.

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| වර්ෂය සඳහා බදු පමා කිරීමේ පොලි ආදායම | 11,080,491.72 | 12,340,283.24 |
| වෙනත් ආදායම | 201.62 | 1,765.81 |
| හඳුනානොගත් තැන්පතු (2017 වර්ෂයේ) | 300,000.00 | - |
| **මුළු ප්‍රමාද ගෙවීම් මත අයකල ගාස්තු** | **11,380,693.34** | **12,342,049.05** |

## 5 අරමුදල් පරිපාලන පිරිවැය

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| මුද්දර ගාස්තු | 73,575.00 | 73,000.00 |
| පරිපාලන වියදම් | 7,464,620.69 | 7,765,924.09 |
| විගණන ගාස්තු | 125,000.00 | 125,000.00 |
| **එකතුව** | **7,663,195.69** | **7,963,924.09** |

## 6 මූල්‍ය පිරිවැය

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| බැංකු ගාස්තු | 40,184.34 | 31,065.00 |
| **එකතුව** | **40,184.34** | **31,065.00** |

## 7 අරමුදල් බෙදාහැරීම්

2005 අංක 38 දරණ සංචාරක පනතේ 24(8) වගන්තියට අනුව අරමුදල් බෙදාහැරීම පහත දැක්වෙන පරිදි වසර තුල සිදු විය.

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 603,460,109.46 | 550,200,713.37 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 3,017,300,547.30 | 2,746,500,754.93 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | 517,251,522.40 | 470,957,352.59 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 172,417,174.13 | 156,985,784.32 |
| **එකතුව** | **4,310,429,353.29** | **3,924,644,605.21** |

## 8 මුදල් සහ මුදල් වලට සමාන දෑ

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| ලංකා බැංකු ගිණුම 7122882 | 414,185,683.61 | 364,686,586.95 |
| සෘජු ප්‍රේෂණ ගිණුම් ලංකා බැංකුව 73104820 | 9,365,747.73 | 8,904,612.97 |
| **එකතුව** | **423,551,431.34** | **373,591,199.92** |

## 9 ලැබිය යුතු දෑ

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| ලැබිය යුතු අපගමන බදු | 468,310,997.89 | 377,735,066.16 |
| ලැබිය යුතු සංචාරක සංවර්ධන බදු | 496,895,172.60 | 549,656,830.58 |
| වෙනත් ණයගැතියන් | 196,921.22 | 1,777,230.60 |
| එකතුව | 965,402,889.56 | 929,169,127.34 |

## 10 ගෙවිය යුතු දෑ

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| සංචාරක සංවර්ධන අරමුදලේ ඇතුලත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අදාල ජංගම ගිණුම | 990,431.50 | 509,834.00 |
| උපචිත වියදම් - පරිපාලන වියදම් | 3,994,346.82 | 4,149,333.10 |
| උපචිත වියදම් - විගණන ගාස්තු | 463,245.00 | 353,920.00 |
| උපචිත වියදම් - මුද්දර ගාස්තු | 73,900.00 | 40,425.00 |
| අනෙකුත් ජංගම වගකීම් | 6,617,371.28 | 332,266.00 |
| **එකතුව** | **12,139,294.60** | **5,385,778.10** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : ටීඅයිපී/ඒ/ටීඩීඑෆ්/01/18/04
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2019 මැයි 14 දින

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

**සංචාරක සංවර්ධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩණ වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සංචාරක සංවර්ධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2003 අංක 25 දරන මුදල් පනතේ 2(ආ) උපවගන්තිය අනුව නැව් මඟින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම අයකරන බදු මුදලින් නිශ්චිත ප්‍රමාණයක් අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතුයි. එසේ වුවද, 2018 වර්ෂය තුළදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරුවලට අනුව පිටත්ව ගොස් ඇති මඟීන් 87,631 දෙනෙකුගෙන් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1.67 ක් බැගින් අරමුදලට ලැබිය යුතු රු. 23,561,347 ක අපගමන බදු ආදායම අයකර ගෙන නොතිබුණි.

(ii) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු වලට අනුව 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් ගුවන් මඟින් පිටව ගොස් ඇති වයස අවුරුදු 02 ට වැඩි ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව 3,922,439 ක් වුවද, අපගමන බදු ප්‍රතිපූර්ණ පත්‍රිකාව අනුව මගීන් සංඛ්‍යාව 3,783,078 ක් වූයෙන් මඟීන් 139,361 ක වෙනසක් නිරීක්ෂණය විය. එම හේතුවෙන් රු.112,185,605 ක අපගමන බදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම,

චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ) (iii) වගන්තියේ අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති



ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
නො.08,ගාලුපාර,කොළඹ 03.
www.slida.gov.lk